මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission

මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක : LAE/2024/EPS/01** **2024. 08.26**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2024
## ඇල්පිටිය ප්‍රාදේශීය සභාව

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ ( 262 වන අධිකාරය ) 26 වන වගන්තිය යටතේ ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති, උප සභාපති සහ සභිකයන් තෝරා පත්කර ගැනීමට අදාළ ඡන්ද විමසීම සඳහා නාමයෝජනා භාරගැනීමේ දැන්වීම ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී විසින් 2024 අගෝස්තු 26 දින ප්‍රසිද්ධ කොට ඇත.

පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් පළමු නාමයෝජනා පත්‍රයේ හා දෙවන නාමයෝජනා පත්‍රයේ නාම යෝජනා කළ යුතු අපේක්ෂකයන් ගණන, පළමු හා දෙවන නාමයෝජනා පත්‍රවලට ඇතුළත් විය යුතු අවම කාන්තා අපේක්ෂිකාවන් ගණන සහ පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල් පිළිබඳ තොරතුරු අදාළ නාමයෝජනා දැන්වීමේ මෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2398 /17 දරන 2024 අගොස්තු 21 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ද පළ කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය www.elections.gov.lk හි ද මෙම තොරතුරු ප්‍රසිද්ධ කොට ඇති බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්